# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,446 - 2025 ජූලි මස 18 වැනි සිකුරාදා - 2025.07.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... | 958 |
| පළාත් පාලන නිවේදන ... ... | 958 |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 961 |
| අයවැය ලේඛන ... ... | — |
| දේපළ විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 අගෝස්තු 07 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ජූලි 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජුනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ.බ.)

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

957 - B 082702 — 5,403 (2025/07)
F 1 -

# බඩුබාහිරාදිය විකිණීම

**ගම්පොල නගර සභාව**

තහනම් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වරිපනම් බදු නොගෙවීම මත නගර සභා ආඥාපනතේ 170 හා ඒ සමඟ කියවිය යුතු මහ නගර සභා ආඥාපනතේ 256 වගන්ති ප්‍රකාරව තහනමට ගන්නා ලද ලී කැබිනෙට්ටුව **2025 අගෝස්තු මස 08 වැනි දින පෙ.ව. 10.00** ට නගර සභා පරිශ්‍ර යේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

එම්. එම්. පී. ඉරුක මිහිරාන් වීරරත්න,
සභාපති,
ගම්පොල නගර සභාව.

07-740

---

# පළාත් පාලන නිවේදන

**කෑගල්ල මහා නගර සභාව**

1975 අංක 17 දරන සමාජ ශාලාවට බලපත්‍ර දීමේ පනත

මෙහි පහත උපලේඛනයෙහි නම සඳහන් තැනැත්තා විසින්, එහි නම ඉදිරියෙන් දැක්වෙන සමාජ ශාලාව එහි සඳහන් ස්ථානයෙහි පැවැත්වීම සඳහා 2026 වර්ෂයට බලපත්‍රයක් ලබා ගැනීමට මා වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කොට ඇති බව 1975 දරන සමාජ ශාලාවට බලපත්‍ර දීමේ පනතේ 06 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. එකී සමාජ ශාලාව පවත්වාගෙන යාම සඳහා යම් පාර්ශවයක්, යම් ආයතනයක් විසින් එම සමාජ ශාලාව සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට සති හතරක් (04) ක් ඇතුළත තම විරෝධතාවයට හේතුව ලියවිල්ලක් මගින් දක්වමින්, පිටපත් දෙකකින් යුක්තව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

නගරාධිපති,
කෑගල්ල මහා නගර සභාව.

2025 ජුලි මස 03 වැනි දින,
කෑගල්ල මහා නගර සභා කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *සමාජ ශාලාවේ සභාපති/ලේකම්* | *සමාජ ශාලාවේ නම* | *සමාජශාලාවේ නව කටයුතු කරගෙන යාමට බලය/පවත්වන ස්ථානය* |
|---|---|---|---|
| විදාන හේනයලාගේ සිරිල්<br>අංක 167/28<br>ඕලගම, කෑගල්ල | සභාපති | බ්ලූ ලයිට් ට්‍රේඩර්ස් ඇන්ඩ් රෙස්ටුරන්ට් | අංක 152<br>කළුගල්ල, කෑගල්ල |

07-698

**මාවනැල්ල ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය සමඟ කියවිය යුතු, සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක 2316/20 සහ 2023 ජනවාරි මස 24 වන දිනැති අතිවිශෙෂ *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති සබරගමුව පළාතේ සභා විසින් පවත්වාගෙන යනු ලබන පාරවල් හා පටු මාවත්වල සැලසුම් පිළියෙල කිරීම හා නාම ලේඛනය දක්වමින් දැන්වීම් පළ කිරීම පිළිබඳ නියෝග මාලාවෙන් සබරගමුව පළාතේ ප්‍රාදේශීය සභාවලට පවරා ඇති කාර්යය අනුව, මෙහි පහත උපලේඛනයේ ඇතුළත් මාර්ගය මාවනැල්ල ප්‍රාදේශීය සභාව සතු වී ඇති මාර්ගයක් වශයෙන් ප්‍රකාශයට පත් කළ යුතු බව 2023.03.14 දිනැති පැවති මහ සභා රැස්වීමේ තීරණ අංක 14 යටතේ අනුමත කරනු ලැබ ඇති බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

එකී උපලේඛනයේ ඇතුළත් මාර්ගය කිසියම් ඉඩමක් හරහා හෝ යම් ඉඩමක කොටසකට ඇතුළත් වන බව, ඒ ඉඩමට හිමිකම් කියනු ලබන පාර්ශවයේ මතය වේ, නම් එකී ඉඩමට තමන්ගේ ඇති අයිතිය ඔප්පු කිරීම සඳහා මේ නිවේදනයේ සිට මාස තුනක කාලයක් ඉකුත් වීමට පෙර නිසි අධිකරණයේ නඩුවක් පැවරීමට ක්‍රියාකළ යුතු බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

තවදුරටත් එසේම, එකී මාස තුනක කාලයක් අවසන් වීමට පෙර එවැනි නඩුවක් පවරා නැති එකී උපලේඛනයේ ඇතුළත් මාර්ගය මාවනැල්ල ප්‍රාදේශීය සභාව සතු කරනු ලැබ ඇති මාර්ගයක් ලෙස සලකනු ලබන බව වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

සජීවනී මැණික් වික්‍රමසූරිය,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක
කිරීමේ නිලධාරී,
ප්‍රාදේශීය සභාව, මාවනැල්ල.


2025 ජුනි මස 16 වැනි දින දී ය.

**උපලේඛනය 01**

| | | |
|---|---|---|
| පාරේ නම | - | වඳුරාගොඩ වත්ත පාර |
| පාරේ දිග | - | 102.88 LM |
| පාරේ පළල | - | 3.05 LM |
| පාරේ ආරම්භය සිට අවසානය දක්වා | - | නාංකුරුගම පාරේ සිට ඒ. ඩබ්ලිව්. ඉන්ද්‍රාවතී යන අයගේ ඉඩම දක්වා |
| ග්‍රාම නිලධාරී වසම | - | 31B නාංකුරුගම වසම |
| මිනින්දෝරු මහතාගේ නම | - | එම්. කේ. එස්. එම්. එම්. දිසානායක |
| ඉඩමේ සැලැස්මේ අංකය සහ දිනය | - | 1992/2022.08.20 |

| *අනුක්‍රමික අංකය* | *වම්පස ඉඩම් හිමියාගේ නම* | *ඉඩමේ නම* |
|---|---|---|
| 01 | ඒ. ඩබ්ලිව්. තිලකරත්න | වඳුරාගොඩ වත්ත |
| 02 | ඒ. ඩබ්ලිව්. සේනාරත්න | වඳුරාගොඩ වත්ත |
| 03 | ඒ. ඩබ්ලිව්. සිරියාවතී | වඳුරාගොඩ වත්ත |
| 04 | ඒ. ඩබ්ලිව්. චන්ද්‍රාවතී | වඳුරාගොඩ වත්ත |

| *අනුක්‍රමික අංකය* | *දකුණුපස ඉඩම් හිමියාගේ නම* | *ඉඩමේ නම* |
|---|---|---|
| 01 | ඒ. ඩබ්ලිව්. ආරියරත්න | වඳුරාගොඩ වත්ත |
| 02 | ඒ. ඩබ්ලිව්. අනුලාවතී | වඳුරාගොඩ වත්ත |
| 03 | ඒ. ඩබ්ලිව්. ඉන්ද්‍රාවතී | වඳුරාගොඩ වත්ත |




| CONTAINING IN EXTENT | | | | | |
|---|---|---|---|---|---|
| LOT NO | A . | R. | P | HECTARE | Sq. Feet |
| 1 | 0 . | 0 . | 17.00 | 0.0430 | 4628.25 |

07-741

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

## කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධියට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සමග කියවිය යුතු 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 216 රීතියේ විධිවිධානවලට අනුකූලවන විගණනය කරන ලද පහත උපලේඛනවල සඳහන් කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහාවන මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, 2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ 2024.12.31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය මහජනතාවගේ දැන ගැනීම සඳහා ප්‍රකාශට පත් කරමි.

ඊ. එම්. විජයසිරි ඒකනායක,
සභාපති,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

2025 ජූලි මස 03 වැනි දින,
කුලියාපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛන I

**කුලියාපිටිය ප්‍රාදේශීය සභාව 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

***මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය***

| **මෙහෙයුම් අයභාරය** | *2024.12.31*<br>*රු. ශත* | *2023.12.31*<br>*රු. ශත* |
|---|---|---|
| රජයේ දායකත්වය - පුනරාවර්තන | 114,563,937.14 | 100,661,009.11 |
| වෙනත් අයභාරය- පුනරාවර්තන | 140,751,309.78 | 137,241,953.45 |
| **මුළු මෙහෙයුම් අයභාරය** | 255,315,246.92 | 237,902,962.56 |
| මෙහෙයුම් වියදම් | | |
| පුනරාවර්තන වියදම් | 204,453,079.66 | 184,685.506.77 |
| **මුළු මෙහෙයුම් වියදම** | 204,453,079.66 | 184,685.506.77 |
| **වර්ෂය සඳහා වන මෙහෙයුම් අතිරික්තය/(ඌනතාවය)** | 50,862,167.26 | 53,217,455.79 |
| ප්‍රාග්ධන ලැබීම් | 12,255,191.94 | 24,407,701.10 |
| ප්‍රාග්ධන වියදම් | 14,600,677.08 | 145,287,715.86 |
| **වර්ෂය සඳහා වන අතිරික්තය/(ඌනතාවය)** | **48,516,682.12** | **(67,662,558.97)** |

මෙම මූල්‍ය ප්‍රකාශයට අදාළ ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් වෙනම දක්වා ඇත.

## උපලේඛන II

### කුලියාපිටිය ප්‍රාදේශීය සභාව 2024.12.31 දිනට *මූල්‍ය තත්ව ප්‍රකාශය*

| **වත්කම්:** | *2024.12.31*<br>*රු. ශත* | *2023.12.31*<br>*රු. ශත* |
|---|---|---|
| **ජංගම නොවන වත්කම් :** | | |
| දේපළ පිරියත සහ උපකරණ | 491,069,246.82 | 413,495,274.93 |
| **ජංගම වත්කම් :** | | |
| තොග | 6,938,808.25 | 7,446,874.50 |
| සේවක ණය | 26,720,819.35 | 24,637,905.25 |
| ලැබිය යුතු දෑ | 149,526,394.41 | 115,184,825.55 |
| ආයෝජන | 16,139,752.57 | 13,512,870.41 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 67,116,774.51 | 68,019,109.67 |
| **මුළු වත්කම්** | **757,511,795.91** | **642.296,860.31** |
| **වගකීම් :** | | |
| ජංගම නොවන වගකීම් | 36,701,242.90 | 24,617,698.11 |
| ජංගම වගකීම් | 36,127,214.40 | 60,103,390.81 |
| හිමිකම් | 684,683,338.72 | 557,575,771.39 |
| **මුළු හිමිකම් හා වගකීම්** | **757,511.795.91** | **642,296,860.31** |

මෙම මූල්‍ය ප්‍රකාශයට අදාළ ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් වෙනම දක්වා ඇත.
මෙම මූල්‍ය සඳහා තත්වාගණනය කළ විගණන මතයක් පවතී.

## උපලේඛන III

### කුලියාපිටිය ප්‍රාදේශීය සභාව 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් *ප්‍රවාහ ප්‍රකාශය*

| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | *2024.12.31*<br>*රු. ශත* | *2023.12.31*<br>*රු. ශත* |
|---|---|---|
| සාමාන්‍ය මෙහෙයුම්වලින් ලද අතිරික්තය/ඌනතාවය | 50,862,167.26 | 53,217,455.79 |
| **මුදල් නොවූ සිදුවීම් සඳහා ගැලපීම්** | | |
| ක්ෂය වීම්/පාරිතෝෂිත වෙන් කිරීම් | - | - |
| පෙර වර්ෂය සඳහා ගැලපීම් | 1,016,913.32 | 161,592,730.71 |
| **කාරක ප්‍රාග්ධන වෙනස් වීම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය/ඌනතාවය** | **51,879,080.58** | **214,810,186.50** |
| තොග ණයගැතියන්/අනෙකුත් ලැබීම් (වැඩිවීම්) අඩුවීම් | (35,916,416.71) | 153,800.035.41 |

| | *2024.12.31*<br>*රු. ශත* | *2023.12.31*<br>*රු. ශත* |
|---|---|---|
| ණය හිමියන් ගෙවිය යුතු දෑ වැඩි වීම (අඩු වීම) | (23,976,176.41) | (196,201,913.86) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(8,013,512.54)** | **172,408,308.05** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය :** | | |
| ස්ථාවර තැන්පතු වෙනස් වීම් | (2,626,882.16) | (426,410.05) |
| ප්‍රාග්ධන වියදම් | (14,600,677.08) | (145,287,715.86) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(17,227,559.24)** | **(145,714,125.91)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය :** | | |
| ප්‍රාග්ධන ලැබීම් | 12,255,191.94 | 24,407,701.10 |
| දේශීය ණය ලබා ගැනීම හා ගෙවීම | 12,083,544,68 | 11,754,698.11 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **24,338,736.62** | **36,162,399.21** |
| වර්ෂය තුළ ශුද්ධ චලනයන් | (902,335.16) | 62,856,581.35 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | 68,019,109.67 | 5,162,528.32 |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන - 1) | 67,116,774.51 | 68,019,109.67 |
| **මුදල් හා මුදල් සමාන දෑ (සටහන 1)** | | |
| ලංකා බැංකුව - ජංගම ගිණුම - 0001472982 | 64,014,036.98 | 64,207,744.83 |
| මහජන බැංකුව - ජංගම ගිණුම - 028-1-001-2-1585686 | 3,102,737.53 | 3,811,364.84 |
| | **67,116,774.51** | **68,019,109.67** |

07-697